# අධිරාජ්‍යාට ඇඳුම් නැත

## හැඳින්වීම

කොවිඩ් - 19 වසංගතය ලොවපුරා ජීවිත සහ ජීවනෝපායන් විනාශ කරමින් පවතී. ඒ හේතුවෙන්, පෙර නොදුටුවිරූ අයුරින් සාමාජීය ආර්ථික අර්බුධ, රැකියා අහිමි වීම නිසා වන අතිවිශාල ප්‍රමාණයේ අවතැන් වීම් සහ අතිශයින් ගෝලීයකරණය වූ ආර්ථිකයේ ඇති අවධානම් නිරාවරණය කරමින් පවතී. අප්‍රේල් 9 වන විට, ඉන්දියාවෙන් කොවිඩ් - 19 රෝගීන් 5,734 වාර්ථා වන අතර, ඉන්දුනිසියාවෙන් රෝගීන් 2,956 සහ ශ්‍රී ලංකාවෙන් රෝගීන් 189ක් ද, කාම්බෝජයෙන් 118ක් ද වාර්ථා වී ඇත.

පුළුල්ව ගත් කල, ආර්ථිකය තුළ නිෂ්පාදන තත්වය මත ආකාර දෙකක ප්‍රතිචාර ආසියානු වසංගත තත්වය උදෙසා දැකිය හැක.

1.

**සම්පූර්ණ වසා දැමීම** - රජය විසින් පූර්ණව රට වසාදැමීම නිසා නිෂ්පාදනය සම්පූර්ණයෙන්ම නවතා දමයි. මෙය ඉන්දියාවේ සහ ශ්‍රී ලංකාවේ පූර්ණ ඇඳිරි නිතිය දැමීමේදී සිදුවේ.

2.

**අර්ධ වසා දැමීම** - මේ සඳහා රජය සම්බන්ධ වේ. එහිදී කර්මාන්තශලා තවදුරටත් ක්‍රියාත්මක වන මුත් ආගමික එක්රැස්වීම්, සංදර්ශන, සුදු පොලවල් ආදිය තහනම් වේ. එසේම කාම්බෝජයේ සිනමා ශාලාද මේ තහනමට ඇතුලත්වන අතර ඉන්දුනිසියාවේ විශේෂ ප්‍රදේශ නිරෝදායනයට ලක්කිරීමද ඇතුලත්ය.

රජය විසින් දක්වන ප්‍රතචාරයන් වෙනස්වීම නිසා රටවල් මෙන්ම කලාප සඳහා ඇතිවී ඇති බලපෑම් විවිධාංගීකරණය වී ඇති අතර ඒ හේතුවෙන් සැපයුම් දාමයේ සිටින සේවකයින් සඳහා ඒ ඒ රටට සුවිශේෂී වූ ගැටළු පැන නගිමින් පවතී. රජයන් විසින් ගන්නා මෙම තීරණ රජයේ ස්වාභාවය වැනි දේශපාලනමය සාධක මෙන්ම අපනයිනික කර්මාන්ත වන ඇගළුම් හා රෙදිපිලි වල භූමිකාව ඇතුලත් ආර්ථිකමය සාධක මත රඳාපවතී. පූර්ණ ආර්ථිකමය වසා දැමීමක් හේතුවෙන් දේශීය ආර්ථිකය කඩාවැටීමකට ලක්වීමේ මූලික සාධකය මත කාම්බෝජය සහ ඉන්දුනිසියාව වැනි රටවල් අර්ධ වසා දැමීමේ තීරණවලට එළඹීමට බලපෑ ඇත.

# රෙදිපිලි කර්මාන්තයේ ප්‍රවණතා

චීනයෙන් මතුවූ මෙම වසංගතය ඊළඟට යුරෝපය සහ නිමි ඇඳුම් නිෂ්පාදනය කරන ආසියාතික රටවල ඉතා සිග්‍රයෙන් පැතිරෙමින් යයි. එය ගෝලීය සැපයුම් දාමයේ විවිධ අංශ සඳහා වෙනස් බලපෑම් එල්ලකර ඇත. වසංගතයේ මූලික අවස්ථාවේදී, චීන අමුද්‍රව්‍ය සැපයීමේ ක්‍රියාවලියේ මන්දගාමී වීම නිසා ශ්‍රී ලංකාව, කාම්බෝජය සහ ඉන්දුනිසියාව යන රටවල නිෂ්පාදනයට ඉතා අහිතකර බලපෑම් ඇති විය. මෙම හේතුවෙන් සාපේක්ෂව ඉන්දියාවට අවම බලපෑම් ඇතිවිය. මේ සඳහා හේතුවන්නේ සංසන්දනාත්මක විශාල වූ දේශීය ආර්ථිකය සහ මාර්තු පළමු සතියේ නිකුත් වූ වාර්ථා අනුව ඉන්දියාව එහි රෙදිපිලි සහ නිමි ඇඳුම් නිෂ්පාදනය වැඩිවන ඉල්ලුම් සඳහා ඉහල දැමීමට යෝජිත වී පැවතීම හේතුවෙනි. එහෙත් මාර්තු 25, 2020 සිට දින 21ක් දක්වා සම්පූර්ණයෙන්ම ඉන්දියාව වසා දැමීමට ගත් අනපේක්ෂිත දැනුම්දීම නිසා අභ්‍යන්තර සැපයුම් දාමයට දැඩි බලපෑම් ඇතිකරමින් නිෂ්පාදන ක්‍රියාවලිය පූර්ණව නවතා දැමීමට පත් වී ඇත. නවතම වාර්ථා දක්වන ආකාරයට වර්තමාන කාර්තුව තුළ නිෂ්පාදනය සැලකිය යුතු මට්ටමකින් පහළ යන අතර එහි ප්‍රතිවිපාක ඉදිරි මාසයන්හි රැකියා මත අහිතකර බලපෑම් ඇති කළ හැක.

නවතම ප්‍රවනතා දක්වන ආකාරයට චීනයෙන් ලැබෙන අමුද්‍රව්‍ය සැපයුම් ප්‍රතිස්ථාපනය වුවද ගැනුම්කරුවන්ගේ ඉල්ලුම පහත යාම නිසා තත්වය තවදුරටත් අස්ථාවර වී තිබේ. කාම්බෝජයේ සහ බංගලාදේශයේ සැපයුම්කරුවන් විසින් සන්නාම සහ වෙලඳ ආයතනයන් හට බලකර සිටින්නේ මිලදීගැනීමේ ගිවිසුම්වලට ගරුකරමින් කටයුතුකරන අතර නිෂ්පාදනය කළ සහ කරමින් සිටින නිෂ්පාදන සඳහා ගෙවීම් කිරීමට අවශ්‍යයෙන් කළයුතු බවය. ඉන්දියාවේ රෙදිපිලි කර්මාන්ත සංගම් එරට රජයෙන් ඉල්ලා සිටින්නේ විශේෂිත පැකේජයක් යෝජනා කිරීමෙන් මූල්‍ය සහනාධාර සපයා කර්මාන්තයේ ඇතිවී ඇති බේදජනක ස්භාවය සඳහා කටයුතු කරන ලෙසය.

අන්තර්ජාතික ගැනුම්කරුවන් ස්වල්ප දෙනෙක් පමණක් නිපදවන ලද හා නිපදවමින් පවතින නිෂ්පාදන සඳහා ගෙවීම් කිරීම සිදුකරන මුත් බොහෝ ගැනුම්කරුවන්/ සන්නාමයන් ඇණවුම් අවලංගු කරනුයේ නැවත ගෙවීම පිළිබඳ කිසිඳු සහතික වීමකින් තොරවය. මෙම හේතුවෙන් සැපයුම්කරුවන් මත අසමාන බරක් පැනවීම සිදුවේ. සමහර සන්නාමයන් නීතිමය වශයෙන් අනුපාතික බලපෑම යටතේ ගෙවීම් නැවැත්වීම අනුමත කර සිටියද එම කොන්දේසිය යටතේ වසංගත තත්වය ආවරණය නොවන අතරම එය අදාළවන්නේ වඩාත් උචිත ගිවිසුම් පාර්ශවය වන සැපයුම්කරුවන් මිස ගැනුම්කරුවන් නොවේය.

ඉන්දියාව, බංගලාදේශය සහ ශ්‍රී ලංකාවෙන් ලැබෙන නවතම වාර්ථාවලට අනුව සන්නාමයන් විසින් 30% වට්ටමක් සැපයුම්කරුවන් විසින් ඔවුන්ට ලබාදිය යුතු බවය. නමුත් මෙම ඉල්ලීම අසාධාරණ වන්නේ අලෙවිය වැඩිවීමකදී සන්නාම අයත් කරගන්නා ලාභය සමානුපාතිකව සැපයුම්කරුවන් හා නිෂ්පාදනය කරන රටවල ශ්‍රමිකයින් අතරේ කිසිදා බෙදීගිය නොමැති හෙයිනි. එසේම නැවිගතකර ඇති සහ එසේ කිරීමට නියමිත නිෂ්පාදන සඳහා වූ ගෙවීම් නැවත සලකා බැලීම් සඳහා වර්තමාන අලෙවි ප්‍රවණතාවය හේතුවක් ලෙස සැළකිය නොහැක. කෙසේවෙතත්, වසංගතය නිසා වන ආර්ථික බලපෑම් හමුවේ නැවත පාරිභෝජක ඉල්ලුම් සහ අලෙවිය ප්‍රතිස්ථාපනය වන කාලයද අවිනිෂ්චිත වේ. මෙම අවිනිස්චිතභාවය ප්‍රධාන ලෙස බලපෑම් ඇතිකරනුයේ අවම කාරක ප්‍රාග්ධන මායිමක් සහිත කුඩා ප්‍රමාණයේ ව්‍යවසායකයන්ටය. එමගින් ඒවායේ කෙටිකාලීන සහ දිගුකාලීන පැවැත්ම පිළිබඳ ප්‍රශ්නාර්ථයන් නැගෙමින් පවතී.

මේ සඳහා රජයේ මැදිහත් වීම බලාපොරොත්තුවන අතර ආර්ථික සහන පැකේජ ප්‍රකාශයට පත්කර ඇතිමුත් උදාහරණයක් ලෙස ඉන්දියාව සහ කාම්බෝජයේ ලබාදී ඇති සහන රැකීරක්ෂා මත වසංගතය නිසා ඇතිවී ඇති බලපෑම් සමඟ සංසන්දනය කරන කල්හී ප්‍රමාණවත් නොවේ. තවද ප්‍රතිපත්තීන් හි පැහැදිලිමත් භාවය සහ ඒවායේ විස්ථර කෙරෙහි අවධානය යොමු කිරීමේ මඳකම නිසා සැලැස්මක් රහිතව කරන ක්‍රියාත්මක කිරීම් මගින් අනපේක්ෂිත ප්‍රතිවිපාක ඇතිවී ඇත. මෙය බොහෝසෙයින් ඇතිවන්නේ රජයේ මූල්‍ය ප්‍රතිපත්ති කෙරෙහි ඇති වගකීම මතය. ඉන්දුනිසියාවේ රජය එවැනි ප්‍රතිපත්ති අතහැර ඇත්තේ රාජ්‍ය මූල්‍ය හිඟයන් ඉවත්කරමින්ය. ඒ සඳහා ඔවුන් ආර්ථික සහන පැකේජ දෙකක් ප්‍රකාශයට පත්කර ඇත. එහෙත්, විශාල ප්‍රමාණයේ රැකියා අහිමිවීම වැළැක්වීම සඳහා මෙම වැඩපිළිවෙලද ප්‍රමාණවත් නොවේ. එම නිසා සිදුවන විනාශයේ වැඩිම බර දරන්නේ සාමාන්‍ය තත්වයේදීවත් ජීවිකාවට සරිලන වැටුපක් නොලැබූ ශ්‍රමිකයන්ය.

## වැටුප සහ සමාජ ආරක්ෂණය

සාමාන්‍ය තත්වයන් යටතේ වුවද ඇඟළුම් ශ්‍රමිකයන්ගේ වැටුප දරිද්‍ර මට්ටමක පවතී. ඉදින්, සාමාන්‍ය ආර්ථික අර්බුධ හමුවේ සංසථායික සහයෝගයන් රහිත අවස්ථාවල මෙම තත්වය ඉතා වේගයෙන් පිරිහීමට ලක්වේ. ඉන්දියාව, ශ්‍රී ලංකාව සහ කාම්බෝජයේ රජයන් විසින් කර්මාන්තශාලා වැසීමේදී ශ්‍රමිකයන්හට වැටුප් දීමනා ගෙවන ලෙස විධිවිදාන නිකුත්කර ඇතත් එය වලංගු වන්නේ ස්ථිර සේවකයන්ටය. කෙටිකාලීන කොන්තාත් පදනමේ හෝ කොටස් අනුපාතයට වැඩකරන සේවකයින් විශාල ප්‍රමාණයක් සිටින ඇඟළුම් ක්ෂේත්‍රය එමගින් ආවරණය නොවේ.

අස්ථාවර ආවස්ථාවලදී එයට මුහුණදෙන ක්ෂණික උපායමාගීයන් ලෙස සමාගම නිෂ්පාදන වියදම් කපාහරී. විශේෂයෙන්ම එය කම්කරු වියදම් වන අතර එය වැටුප් කප්පාදුකිරීමෙන් හෝ රැකියා නැවැත්වීම මගින්

සිදුකරයි. වර්තමානයේ ශ්‍රමිකයින්ගේ වැටුප්වලට බලපාන එමගින් අස්ථිරභාවය දනවන යාන්ත්‍රණ හයක් හඳුනාගත හැකිය.

1. වසාදමන කාලය තුළ වැටුප් නොගෙවීම.
2. දින 10-20 දක්වා වැටුප් ගෙවීම කල් දැමීම.
3. කොන්තාත්කරු හෝ සේවා යෝජකයා විසින් වැටුප් වෙනුවට පොලී රහිත හෝ සහිත නැවත ගෙවියයුතු කෙටිකාලීන ණය ලබාදීම.
4. නිමකරණ ලද වැඩ සඳහා වැටුප් නොගෙවීම.
5. දීමනා රහිතව රැකියා නැවැත්වීම.
6. රජයේ සහයෝගය මගින් වැටුපෙන් කොටසක් ගෙවීම.

ඉන්දියාවේ කාර්මික මධ්‍යස්ථානවල - ගුරාජන්, තිර්පූර්, සුරාත් සහ අහමාභාත් හි සේවකයින් හට පූර්ව මාසය සඳහා සම්පූර්ණ වැටුප නොගෙවා ඇත. මෙය රජයේ විධිවිධාන වලට ප්‍රතිවිරුද්ධය. එසේම මෙම ප්‍රදේශවල පවතින කුඩා පරිමාණයේ කර්මාන්තශාලාවල සේවකයින් හට දැනුම් දී ඇත්තේ ඔවුන්ගේ වැටුප් දින 10-20 අතර කාලයකින් කල්යන බවය.

ලුඩ්හියානා, ගුර්ජාගන් හා අහමාභාත් හි කොන්ත්‍රාත් පදනම් සේවකයින් බොහොමදෙනෙක් සංක්‍රමණිකයන් වන අතර ඔවුන්ගේ මාර්තු මාසයේ වැටුප ලබා නොදී ඇති අතරම කොන්ත්‍රක්කරුවන් විසින් ඔවුන්ව අතරමං කර ඇත. එසේම ගුරාජන්හි කොන්ත්‍රක්කරුවන්/ සේවා යෝජකයන් විසින් වසාදමා ඇති කාලය සඳහා ගෙවීම් ප්‍රතික්ෂේපකර ඇති අතර ඒ වෙනුවට නැවත සේවය ආරම්භකිරීමේදී ගෙවිය යුතු ණය ලබාදී ඇත.

ශ්‍රී ලංකාවේ ඇගළුම් සේවකයින් හට මාර්තු 10 ලැබිය යුතු වැටුප ලැබීඇති අතර මාර්තු 25 සහ 30 දිනවලදී වැටුප් ලැබිය යුතු සේවකයින්ගේ ගෙවීම් ලැබී නොමැත. ශ්‍රී ලංකාවේ ඇගළුම් ක්ෂේත්‍රයේ ස්ථිර සේවකයින් ඇතුළුව අවම 30% ප්‍රතිශතයක්ගේ රැකියා අහිමිවන අතර එය ශල්‍ය ගවුම් සහ මුඛ ආවරණ මැසීම සඳහා අන්තර්ජාතික ඇනවුම් ලැබීමෙන් නැවැත්විය නොහැක.

කාම්බෝජය සහ ඉන්දුනිසියාව යන රටවල් දෙකෙහිම දහස්ගණනක් සේවකයින්ගේ රැකියා මහා පරිමාණයෙන් නවතා ඇත. අප්‍රේල් 1 වන විට කාම්බෝජයේ 91 පමණ ඇගළුම් කර්මාන්තශාලා 61,000 පමණ වන සේවකයින් සමඟ ක්‍රියාකාරීත්වය අත්හිටුවා ඇත. ඉන්දුනිසියාවේ කොවිඩ් - 19 අර්බුධය නිසා 2008 වූ සමාගම් හි 16,065 සේවකයින්ගේ රැකියා නවතාදමන ලදි. මේ හේතුවෙන් වැටුප් කප්පාදුකිරීම් සහ රැකියා නැවැත්වීම් ආදියට එරෙහිව විරෝධතා දක්වා ඇත. උදාහරණයක් ලෙස, PT බින්ටැන්ග් ඉන්ටි කාර්ය, නැගෙනහිර ජාවා ප්‍රදේශය, වැටුපෙන් අර්ධයක් මාස 3ක් සඳහා ලබාදීම සදහා සමාගම විසින් ගත් තනි තීරණයට එරෙහිව විරෝධතා දක්වා ඇත.

ඉන්පසුව රජය විසින් ඉතිරි අර්ධය ගෙවීමට තිරණය කර ඇත. එසේම පි.ටි. හෙයාර් ස්ටාර් ඉන්දුනිසියා සමාගම විසින් රැකියා නැවැත්වීමේ උත්සහයක් දරා ඇත්තේ එය ලබාදුන් අවම වැටුපටත් වඩා අඩු අගයක් ගෙවීමට ගත් තීරණය සේවකයන් ප්‍රතික්ෂේප කිරීම නිසාවෙනි.

කාම්බෝජයේ එරට රජය ප්‍රකාශකළ පරිදි අවම වැටුපෙන් 60% ක්, වර්තමාන අර්බුධයට මුහුණදී ඇති ඇගළුම් සේවකයින් සඳහා ලබාදෙන බවය. 114$ වන මාසික වැටුපෙන් 70$ පමණක් ලබාදෙන බව නවතම වාර්ථා අනුව දක්වන අතර එය වැටුපෙන් 37%ක් වේ. එසේම ශ්‍රමිකයන් විසින් නිවස් කරා එවන මුදල් සම්ප්‍රේෂණය අඩුවීම නිසා තවදුරටත් ග්‍රාමීය ආර්ථිකය අවපාත වීම සිදුවිය හැක. ප්‍රමාණවත් සමාජ ආරක්ෂණයක් නැතිවම හෝ එය බලාත්මක නොවීම නිසා මෙම අර්බුධ සමයේ සේවකයින්ගේ පාරිතෝෂක දීමනා සහ අනෙකුත් වන්දි ගෙවීම් නොලැබී යා හැක. එසේම අනිවාර්යෙන් සඳහන් කළ යුතු කාරණය වන්නේ මෙවැනි දීමනා සංක්‍රමණික කොන්ත්‍රාත් පදනමින් සේවය කරන කුඩා පරිමාණ කර්මාන්තශාලා සේවකයින් හා ගෘහාශ්‍රිතව කර්මාන්තවල යෙදෙන සේවකයන්ට හිමි නොවේ. එම නිසා වසංගතය හේතුවෙන් සංක්‍රමණික සේවයන් මුහුණ දෙන සාමාජීය හා ආර්ථීක අර්බුධ ඉතා හදිසි ක්‍රියාපටිපාටියන් මගින් පාලනය කළයුතු වන්නේ සංක්‍රමණය වනාහි සංසිද්ධියත් මෙන්ම සීමාකිරීමක්ද වන බැවිනි.

# සංක්‍රමණික සේවකයන්ගේ නික්මයාම

ආර්ථික ක්‍රියාකාරීත්වය නැවතීම සහ වියදම් කපාහැරීම හේතුවෙන් සංක්‍රමණික සේවකයන් නැවත ඔවුන්ගේ නිවස කරා යාමට උත්සහකර ඇත. එහෙයින් පෙර නොදුටු අයුරින් ඔවුන් නික්ම යන අයුරු දැකගත හැක. මෙය විශාල වශයෙන් ප්‍රතිවිරුද්ධ සංක්‍රමණ වීමක් වන අතර එය ක්‍රියාකාරීවන සාධක වන්නේ රැකියා නොමැති වීම, අධි අවදානමකට නිරාවරණය සහ ඉහළ යන ජීවන වියදම (නාගරික හා කාර්මික ප්‍රදේශවල) ; එසේම සංස්කෘතිමය හේතූන් (පාස්කු, රාමසාන් සහ කාම්බෝජ අලුත් අවුරුද්ද) බලපා ඇත. මේ අතරම දුෂ්කර කාල සමයේ නැවත පවුල් වෙත යාම ආරක්ෂාකාරී පියවරක් ලෙස සිතීමද හේතුවේ. වර්තමානයේ තුන් ආකාරයක සංක්‍රමණිකවීම් දැකිය හැක, - ප්‍රදේශ තුළ (රටක කිසියම් ප්‍රාන්තයක් තුළ), ප්‍රදේශ අතර (රටක ප්‍රාන්ත අතර) සහ අන්තර්ජාතික (රටවල් අතර).

a. **අභ්‍යන්තර ප්‍රදේශ සංක්‍රමණය**, කාර්මික දිස්ත්‍රික්කවල සිට දිළිඳු සහ කාර්මික නොවන දිස්ත්‍රික්ක වෙත එකම ප්‍රාන්තයක් තුළ යම් රටක වන සංක්‍රමණය. ප්‍රාන්ත ප්‍රතිපත්ති මගින් සේවකයන් මත වන වෙනස් බලපෑම් අවස්ථා දෙකකදී ප්‍රදර්ශනය වේ. පරික්ෂාන්හි සේවකයින් ඉන්දියාව වසා දැමීම සිදුවූ විට පැවති ගමනාගමන සේවා භාවිතා කරමින් ඔවුන්ට තම ගම් පිහිටි දිස්ත්‍රික්ක වෙත යාමට හැකි විය. එහෙත් ගුජරාමයේ සංක්‍රමණික සේවකයින් ඉතා විශාල ප්‍රමාණයන් පා ගමනින් උතුරු කාර්මික ප්‍රදේශවල සිට දකුණු ගම් පළාත් දක්වා යාමට සිදු විය. මෙය සිදුවීමට හේතු වූයේ රට සම්පූර්ණයෙන් වසා දැමීමේ තීරණය ක්‍රියාත්මක කිරීම එහි දුර්වල වූ බැවින් සමහර කාර්මික ප්‍රදේශ එම නියෝග නොතකා තවදුරටත් නිෂ්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම නිසාය. ඒ හේතුවෙන් රජය විධිවිධාන තරකර සිටිය විට රජය/ පෞද්ගලික ප්‍රවාහන සේවා එම සේවකයන්ට ලබාගැනීමට නොපැවතින.

b. **අභ්‍යන්තර ප්‍රදේශ තුළ විශාල වශයෙන් වන සංක්‍රමණය**, මෙය රටක ප්‍රන්ත අතර සිදුවේ. එය මෙම අර්බුධය සඳහා රජයේ ප්‍රතිපත්ති පිළිබඳ ඉස්මතු කිරීම සිදුකරයි.

ඉන්දුනිසියාවේ 100,000 වැඩි සංක්‍රමණික සේවකයින් ප්‍රමාණයක් එහි ජනාකීර්ණ බටහිර ජාවා ප්‍රදේශයේ සිට ඔවුන්ගේ ගම්මාන කරා ගොස් ඇත. ඔවුන් එසේ ගමන්කර ඇත්තේ ගම්මාන කරා යෑම නොකරන ලෙස රජය බලකර සිටියදීය. එරට රජය තවමත් සංක්‍රමණික නික්මයාම ආමන්ත්‍රණය කිරීම සඳහා උපායමාර්ග ගෙනනැති අතර එරටෙහි කොවිඩ් - 19 රෝගීන්ද ඉහළ යමින් පවතී. ශ්‍රී ලංකාවේ, කටුනායක සහ බියගම නිදහස් ආර්ථික කලාපයේ 10,000කට වැඩි සංක්‍රමණිකයන් රැකියා කරමින් ජීවත් වේ. NGO සහ කම්කරු සංගම්වල බලපෑම මත රජය විසින් පහසුකම් සැළසීම යටතේ නිවාසකරා යවා ඇත. ක්ෂේත්‍ර වාර්ථා අනුව ශ්‍රමිකයින් රෝග ලක්ෂණ සඳහා ආවරණය කිරීම සහ පොලිස් ස්ථානයන්හි ලියාපදිංචිය සහ නිවාස වෙත ගිය පසු ස්වයං හෝ නිවාස නිරෝදායනය ක්‍රියාවලියට ලක්විය යුතුය. ක්ෂණික පහසුකම් ලබාදීමේදී ප්‍රමාදයන් ඇති වුවද, ශ්‍රී ලංකා රජය ඉන්දියාවට සාපේක්ෂව ඉතාමත් හොඳ තත්වයකින් තත්වය සමනය කරන ලදි. ඉන්දියාවේ ඉතා විශාල ප්‍රමාණයේ අවතැන්වීම් ජනමාධ්‍ය අවධානය දිනා ඇත. මෙම අර්බුධය හෝලි උත්සවයෙන් පසු ආරම්භ විය. එය උතුරු ඉන්දියාවේ වැදගත් අංගයක් වන අතර සාමාන්‍යයෙන් දරිද්‍ර මට්ටමේ වැටුප් ලබන, අවම තැන්පතු ඇති සහ ණය සහිත ශ්‍රමිකයින් සඳහා ගම් බිම් බලා ගමන් කරයි. එම නිසා අහමාභාත්, සුරාත්, ගුරගාඕන් සහ නොයිඩා වැනි කාර්මික මධ්‍යස්ථාන ප්‍රදේශවලින් සංක්‍රමණික සේවකයින් ඔවුන්ගේ ගම් ප්‍රදේශවන බිහාර්, මධ්‍ය ප්‍රදේශ්, රාජස්ථානය සහ උත්තර ප්‍රදේශ් සහ ඔරිස්සාවට ගොස් ඇත. උතුරු ඉන්දියානු ප්‍රදේශයේ ගමනාගමන සේවා රහිත වීම නිසා කිලෝමීටර දහස් ගණන් දුර ඔවුන් පාගමනින් ගමන් කර ඇත. එමගින් වැඩකරන දුගී ජනතාව කෙරෙහි එම රජයේ දයා රහිත බව සහ නොසැලකිල්ල ප්‍රදර්ශණය වේ. උදාහරණයක් ලෙස සමහර සංක්‍රමණික සේවකයින් ලුඩිහයිනාහි ඇගළුම් කර්මාන්ත ප්‍රදේශයේ සිට ඔවුන්ගේ ගම්පලාත් වන උත්තර ප්‍රදේශය සහ බිහාරය දක්වා ගමන් කිරීමේදී සහරාන්පූර් හිදී කිසිදු පිලිසරණක් රහිතවී අරක්ෂිත නිවාස කරා යවා ඇති අතර එහි එක් ආහාර වේලක් සහ පිරිසිදු සනීපාරක්ෂක පහසුකම් රහිතව රැදීමට සිදුවී ඇත. අවම වශයෙන් සංක්‍රමණික සේවකයින් 22 පා ගමනින් නිවාස කරා යාමේදී මියගොස් ඇත. බෙරිල්හි, උත්තර ප්‍රදේශයේ දී තවත් සේවක සමූහයකට ඉතා ප්‍රාථමික ආකාරයේ වෙනස් කර සැලකීමට භාජනය කර ඇත්තේ ඔවුන්ව විශබීජනාෂක දියර ඉසීමෙනි. එය, සමාජ මාධ්‍යතුල කැළඹීමක් ඇති කර ඇත. මේ අතර ගම්පලාත් බලා යාමට හැකිවූ සේවකයින් ඔවුන්ගේ ප්‍රදේශවාසීන් විසින් පොලිසියට භාරදීම හෝ ගම්මානයට ඇතුල්වීම වළක්වමින් හෝ ජලය ලබාගැනීමෙන් වළක්වන සමාජමය නෙරපීමකට ලක්කිරීම් බිහාරයෙන් වාර්ථාවේ. උත්තර ප්‍රදේශයෙන් වාර්ථා වන පරිදි ග්‍රාමීය පාසලක් තුල නිරෝධායනය වෙමින් සිටි දාලිත් සංක්‍රමණික සේවකයෙක් ගෙල වැළලා මියගොස් ඇත්තේ ඔහුගේ මධ්‍යස්ථානයේ ආහාර ලබාගැනීමට උත්සහ කිරීමේදී පොලිසිය මඟින් ලැජ්ජාවට සහ පහර කෑමට ලක්වීම හේතුවෙනි. මෙවැනි සංසිද්ධීන් මඟින් නැවතත් ඉන්දියාව තුල, පැරණි කුල පංති සහ ස්ත්‍රී පුරුෂ භාවය මත පදනම් වී වෙනස් ලෙස සැළකීම ප්‍රදර්ශනය වේ.

c. **අන්තර්ජාතික සංක්‍රමණය**, මෙය විශේෂයෙන්ම තායිලන්තයේ ඇගළුම් කර්මාන්තවල සේවයේ යෙදී සිටින කාම්බෝජ සංක්‍රමණ සේවකයින්ගේ ඛේදනීය තත්වයන් මැනගත හැක. දහස් ගණනක් සේවකයින් තායිලන්තයේ සිට කාම්බෝජයට පැමිණ ඇත. එය නිෂ්පාදන ක්‍රියාවලිය අඩපණවීම නිසා සිදු වී ඇති අතර නැවත රැකියා සොයාගැනීම පිළිබඳ ඔවුන් දැඩි සංවේගයෙන් සිටිති. මෙම සංක්‍රමණික ගැලීමට නීත්‍යානුකූල නොවන දැඩි සූරාකෑමට ලක්වන සංක්‍රමණිකයන් සහ නිත්‍යානුකූල සංක්‍රමණිකයන් යන දෙකොටසට අයත් වේ.

තවදුරටත් තායිලන්තයේ රැඳිසිටින කාම්බෝජ කම්කරුවන් ආර්ථිකමය වශයෙන් දැඩි අනතුරක සිටින්නේ වැඩිවන නාගරික ජීවන වියදම් මෙන්ම රජය විසින් ලබාදෙන සමාජ ආරක්ෂණ ක්‍රියාවලිය සඳහා සුදුසුකම් නොලැබීම හේතුවෙනි. ඔවුන් තායිලන්තයේ රැඳී සිටීමට හේතුවන්නේ කාම්බෝජයේ කොවිඩ් - 19 පාලනය සඳහා සක්‍රිය සූදානමක් රහිත වීම, නැවත ගමන්කිරීමේදී මඟීන් පිරුණු බස්රථ සහ රටවල් අතර දේශසීමාවලදී රෝගයට නිරාවරණයවීමේ අවධානම නිසා මෙන්ම ඉතා අඩු පහසුකම් යටතේ නිරෝධායනය වීමට ඇති බිය නිසාවෙනි.

# සෞඛ්‍ය සේවා

වැඩකරන දුගී ජනතාව ඔවුන්ගේ නිවාසවලදී, ප්‍රවාහන සේවා තුලදී මෙන්ම රැකියා කර්මාන්තශාලා තුලදීපවා රෝගය වැළඳීමට ඇති ඉඩකඩ ඉතා ඉහලය. නේවාසිකාගාර/ නිවාස තුල වූ වැසුණු කුඩා කාමර තුල බොහෝ ඇඟළුම් සේවකයින් සිටින අතර එක් කාමරයක් 5-10 දෙනෙක් විසින් බෙදාගනී. ඔවුන් පිරිසිදු සනීපාරක්ෂක පහසුකම් රහිතව සිටින නිසා අධි අවධානමකට ලක් වී ඇත.

බෙන්ගනාරුළුහී ක්ෂේත්‍ර වාර්ථා අනුව නේවාසිකාගාරවල සේවකයින් දිනකට එක් ආහාර වේලක් මත යැපෙන අතර ආහාර නිතිපතා නොලැබෙනා මෙන්ම නේවාසිකාගාර වලින් පිටවීමද තහනම් වේ. තමිල්නාඩුවේ රෝහල් සඳහා මුඛ ආවරණ නිපදවන කර්මාන්තශාලා තුල සේවකයින් ඉතා ළගින් සිට ක්‍රියාකිරීම නිසා ඔවුන් වසංගත වෛරස වාහකයන් වීමේ තත්වයක් මතුවීමට ඉඩ ඇත. එක් රෝගියෙකු වාර්ථා වූ විට රෝගය පැතිරීමේ අධි අවධානම (අවම වූ සනීපාරක්ෂක පහසුකම්වත් රහිත නේවාසිකාගාර සහ කර්මාන්තශාලා නිසා) ඉතා ඉහළ යා හැක. එසේම බෙන්ගලූරුහි සේවකයින් මෙම සෞඛ්‍ය හා ආරක්ෂාව ගැන නොසැලකිල්ල සහ දයාරහිතව කටයුතු කරන පරිපාලනයට සහ සන්නාමයන්ට එරෙහිව විරෝධතා දක්වා ඇත. ඔවුන්ගේ විරෝධතා සමයේ වැටුප් ලැබුනද වසාදැමීම නිසා වූ කාලයට වැටුප් ගෙවා නැත.

කාම්බෝජයේ සහ ඉන්දුනිසියාවේ සේවකයින් තවදුරටත් සේවයේ නියුතු අතර එහි මගී ප්‍රවාහන සේවා පිරී ඉතිරී යෑමෙන් සමාජ දුරස්ථභාවය පැවැත්වීම කඩවී ඇත. ශ්‍රමිකයින්ගේ ශරීර උෂ්ණත්වය කර්මාන්ත ශාලා තුල මැන බැලුවද එය රෝගය හඳුනාගැනීමට සාර්ථක ක්‍රමයක් නොවන්නේ රෝග ලක්ෂණ රහිතව රෝගියෙකුට ආසන්න ලෙස සති දෙකක කාලයක් සිටිය හැකි බැවිනි.

වෘත්තිය සමිති වලින් කල වඩා මානුෂික තත්වයන් ලබාදෙන ලෙස කරන ලද ඉල්ලීම්වලට පටහැනිව ශ්‍රමිකයින්ගේ සමෘද්ධිය කෙටි කාලීන ලාභ වෙනුවෙන් හුවමාරු කිරීම පසුගිය වෂී ගනණාවක සිට වන වෘත්තිමය ආරක්ෂාව පිළිබඳ නොසැලකිල්ලේ දිගුවක් ලෙස මෙය අත්‍යවශ්‍යයෙන් හඳුනාගත යුතුය. ඉහත දැක්වූ උදාහරණවලට අනුව සමාජ දුරස්ථභාවය පැහැදිලිවම වරප්‍රසාදයක් වන අතර බහුතරයක් කනස්සලු වන්නේ රැකියා අහිමි වීම සහ කුසගින්න නිසා වන දන්නා භිය වන අතර වසංගතය නිසා වන නොදන්නා භිය නොවේ. එම නිසා වෛරසයට නිරාවරනය වීමේ අවධානම නොතකා ඔවුහු වැඩ කිරීමට පෙළඹේ.

මීට අමතර සුවිශේෂී කරුණු දෙකක්ද මෙම ස්වාභාවය මත දැක්විය යුතුය. පළමුව, සංක්‍රමණික ශ්‍රමිකයන් හට පවතින සෞඛ්‍ය ගැටළු සඳහා වෙනස්කොට සැලකීම සහ සෞඛ්‍ය සේවයේ ඇති පහසුකම් මද වීම නිසා සේවය ලබාගැනීමට නොහැකි වී ඇත. උදහරණයක් ලෙස දුගී සංක්‍රමණිකයන්හට මාතෘ සෞඛ්‍ය සේවාවන් ලබාගැනීම ඉතා විශාල ගැටළුකාරී තත්වයක්ව පවතී. ක්ෂේත්‍ර වාර්ථා අනුව ගුජරාටයේ ගර්භණී සංක්‍රමණික කාන්තාවන්හට ඉතා විශාල මුදලක් ගෙවා පෞද්ගලික සේවා ලබාගැනීමට සිදුවී ඇත්තේ රජයේ සෞඛ්‍ය සේවා සඳහා ඇතුලත් විය නොහැකි වීමෙනි.

දෙවනුව, කොවිඩ් - 19 පැතිරීම තුල බොහෝවිට ශ්‍රමිකයින්හට විපත්තිකර සෞඛ්‍ය ආශ්‍රිත වියදම් දරාගැනීමට සිදුවන අතර එය ඔවුන් දරිද්‍රතාවයට සහ ණය වීම් වලට ඇද දමයි. ඉතා කුඩා තැන්පතු හෝ ඒවා රහිතව, වැඩිවන සෞඛ්‍ය වියදම් නිසා වැඩකරන පන්තියේ බොහෝ පවුල් ඉතා දුෂ්කරතාවයට පත් විය හැකිය. මෙම තත්වය තවදුරටත් ඉහල යා හැක්කේ රැකියා අහිමිවීම නිසා ආදායම් ජනනය නොවන විට සෞඛ්‍ය පිරිහීමේ අවස්ථාවකදීය. මෙය නව ලිබරල්වාදී ආර්ථික ප්‍රතිපත්තීන් කෙරෙහි රජයන්ගේ කැපවීම හේතුවෙන් පොදු සෞඛ්‍ය සේවා සඳහා කාලාන්තරයක් අඩු පහසුකම් සහ මුදල් යෙදවීම නිසා ඇතිවූ ව්‍යුහාත්මක අර්බුධයක් බව දිස්වේ. එය දුගී ජනයා අතිමහත් අවධානම් තත්වයට පත් කරන අතර ඔවුන් වෛරසයට ගොදුරුවුවුවහොත් ද්විත්ව අභියෝගයන් වන ජීවනෝපාය සහ සෞඛ්‍ය යන්න මැඩලිය යුතුය. වාර්ථා තවදුරටත් දක්වන පරිදි ගෘහස්ථ හිංසන සිද්ධීන්ගේ ඉහළ යෑමක් පෙන්නුම් කරන අතර එය නොවැදගත්සේ සළකන ජනකොටස්වල කාන්තාවන්ට වැඩි වශයෙන් බලපාන්නේ ඔවුන්ට විධිමත් ක්‍රමවේදයන්ද ඇතුලත්වී එම සිද්ධීන් දැන්වීමට ක්‍රමයන් රහිත වීම නිසාය.

# සමාප්ත සටහන

කොවිඩ් - 19 වසංගතය පෙර නොදුටු සාමාජීය - ආර්ථිකමය අර්බුධයන් උත්පාදනය කර ඇති අතර නිෂ්පාදනයේ සහ ඉල්ලුම තුල ඇතිවී ඇති අර්බුධ ගෝලීය සැපයුම් දාමයේ පහළට ගමන් කරයි. එමගින් එහි සිටින ශ්‍රමිකයින් වඩාත් බලපෑමකට ලක්වී ඇත. කවදා කර්මාන්තයේ වර්ධනය ප්‍රතිස්ථාපනයවන කාලය පිළිබඳ එකඟතාවයක් නොමැති බැවින් එය ශ්‍රමිකයින් ඉතා අස්ථායි තත්වයට පත්කර තිබේ. මෙම වාර්ථාව මගින් උත්සහ කර ඇත්තේ මෙම තත්වය ප්‍රධාන ඇඟළුම් හා රෙදිපිලි නිෂ්පාදනය කරන ආසියාතික රටවල් තුල ස්ථානීය වශයෙන් බලපා ඇති ප්‍රධාන ආකාර දෙස බැලීමටය. වසංගතය නිසා වන බලපෑම්, සංස්ථාපිත ක්‍රියාමාර්ගවල සතර ආකාර පථයන් එනම් වැටුප් ගෙවීම්, සමාජ ආරක්ෂණය, සංක්‍රමණය සහ සෞඛ්‍ය සේවා පිළිබඳ විශේෂ අවධානයක් යොමුවිය.

ලාභය පුද්ගලයන්ට වඩා සහ පළමුව කපා දැමිය යුතු දෙය වැටුප් ලෙස සළකරන සංස්ථාවක් තුළ දුගී ශ්‍රමිකයින්ගේ සමාජ ආරක්ෂාව දැඩි විනාශයකට පත් වී ඇත. පොදු සෞඛ්‍ය සේවා ප්‍රමාණාත් නොවන අතර අවම ලෙස මුදල් යොදවා ඇත. සංක්‍රමණික සේවකයින් ශ්‍රම බලකාය තුල වඩාත් අවධානමක මෙන්ම අඩුවෙන් වැටුප් ලබන හා අත්හැර දැමූ කොටස් වේ. මෙම ස්වාභාවය මත කරුණු දෙකක් නැගිය යුතුය.

පළමුවැන්න වන්නේ, මෙවැනි අවස්ථාවක රජය ඉදිරිපත් විය යුතු වුවද රජය විසින් එසේ නොකරයි. එයට හේතු වන්නේ එහි වියදම් කිරීමේ හැකියාව සාමාන්‍ය තත්වයකදී වුවද සීමාකිරීමේ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති සඳහා බැඳී තිබීමයි. නව ලිබරල්වාදී ආර්ථික ප්‍රතිපත්ති ඉවතලා ප්‍රතිගාමී බදු අයකරන ප්‍රතිපත්තීන්, ධනය ප්‍රතිව්‍යාප්තිය සහ විශාල උත්තේජක පැකේජ මගින් ජීවනෝපායන් ආරක්ෂාකළ හැකි අතර රැකියා අවස්ථා සහ පොදු සෞඛ්‍ය සේවාව සහ රැස්වීමට ඇති නිදහස තහවුරු කිරීම රජයන්ගේ ඉදිරි කාර්යභාරය වේ.

දෙවනුව, වේගවත් විලාසිතා කර්මාන්තයේ අන්තර් සන්නාම තරඟය නිසා දියුණුවෙමින් පවතින රටවල දුගී ශ්‍රමිකයින් හට අවම වැටුප් සහ අවම හෝ ආරක්ෂාවක් සහිතව හෝ රහිතව සිටීමට හේතුවේ.

වැඩි ප්‍රමාණයක් නිපදවීමේ තරඟය, දුගී කම්කැරුවන් තවදුරටත් දුගී භාවය පහතටම හෙළීමේ තරඟයකි. එය සඳහා ස්ථානීය නිෂ්පාදකයින් හා සැපයුම්කරුවන් අවධානම් තත්වවල ජීවත්වන සහ රැකියා කරන කොන්ත්‍රාක් පදනම් සේවකයින් යොදවාගෙන ඇත.

එම නිසා නොදුටු අවධානම් හමුවේ එවැනි ශ්‍රමිකයින් ආරක්ෂාකිරීමට ඉදිරිපත් වී සහ ක්‍රියාදාමයන් යෙදවීම සන්නාමයන්හි ආර්ථික සහ ආචාරධර්මීය වගකීමක් වේ. එවැනි තත්වයක් සඳහා ගතහැකි ප්‍රධාන පියවරක් වන්නේ වෘත්තිය සමිති මගින් සාමූහික කේවල් කිරීමෙන් සහ කම්කරු ව්‍යාපාරයෙන් එකමුතුභාවය වඩා ශක්තිමත් කිරීමෙනි.